# භූතාත්මයක සමුගැනීම

මනෝජ් දාස් ගේ Farewell to a ghost කෙටිකතාව

පරිවර්තනය - වැවල ධම්මාලෝක හිමි

පාළු වලව්ව සුවිශේෂ මන මෝහනීයත්වයකින් දර්ශනය විය. ගං ඉවුරේ සිට අපි නිහඬව දිගු වේලාවක් ඒ දෙස බලා සිටියෙමු. විටින් විට හමා එන මඳ සුළඟින් වලව්ව වටා පැතිරුණු කහපාට උස් තණ බිම රැලි නංවමින් වැනී ගියේ ය. ඒ දසුන සුරංගනා කතාවක එන අද්භූත මුහුදක් මැද පිහිටි මායා මාලිගාවකට සමාන විය. එහෙත් මා නැවතත් කිව යුතු යි: ඒ අඳුරු හුදෙකලා, බියජනක බව කෙසේ වුවත් එය සිත් පැහැරගන්නා වලව්වකි.

සාමාන්‍යයෙන් අපි රාත්‍රි කාලයේ කතාබස් නොකළෙමු. එහෙත් පසු දා උදෑසන අප අතර සිටි අයෙකු තවත් කෙනෙකුට කියන ලදරහසක්සවස් වන විට අප සියලු දෙනාට ම දැන ගන්න ලැබිණි. එනම්, වලව්වේ අබලන් වූ සඳලු තලය මත හිඳ රන් වන් කඳුළු බිඳු සලමින් සඳ දෙස හෝ පහළ ගං දිය දෙස බලා සිටින ගැහැණු ළමයෙකු ගේ රුවක් ඔහුට දර්ශනය වී ඇති බවයි. එහෙත් ඒ අලුත් කතාවක් නම් නොවේ. කෙසේවුවත් අපි සැමදාම ඒ කතාවෙන් සතුටට පත් වී පසු දා සැන්දෑවෙත් ගං ඉවුරේ නැවතී සිටින්නෙමු.

ගම් දරුවන් වූ අපි සියලු දෙනා ම ඇයට කිසි යම් විධියක උපකාරයක්කිරීමට කැමැත්තෙන් සිටියෙමු. එහෙත් අපි ඇය වෙනුවෙන් කළහැකි කිසිවක් නොමැති බව ද දැන සිටියෙමු. ඈ අපට එතරම්ම ළඟින් සිටියාය. එහෙත් ඈ දුර ඈත ලොවකට අයිති වූවාය. මේ හැර අපට ඇගේ සිත අප කෙරෙහි පොළඹවා ගැනීමට හැකියාක් තිබේ දැයිපරීක්ෂා කිරීමට ද අවශ්‍ය විය. ඇය සමඟ පෙමින් බැඳී සිටි, පසු ගිය පරම්පරාවක නිර්භීත කොල්ලා පිළිබඳ කතාව නොයෙක් විට අප අසා ඇත.

වලව්ව ආසන්නයේ ගං ඉවුර අද්දර දැඩි පාළු හුදෙකලාබවකින් යුත් විශාල නුග ගසක් තිබිණි. මේ කොල්ලා නිරතුරු ඔහුගේ නිවසින් රහසින් පැන ඇවිත් මේ ගසට නගී. අනතුරුව ඔහු

ගසේ අත්තක් මත වාඩි වී වලව්වේ ඉහළ මාලයේ පිහිටි සුන්බුන්ව ගිය කාමරයක් දෙස සුළඟින් බිඳී ගිය ජනේලයක් තුළින් බලා සිටී. ඒ කාමරය තුළ සුපුරුදු සෝකී බවින් යුතුව කුඩා ඇඳ මත වාඩි වී සිටින ඇය ඔහුට දර්ශනය වු ආකාරය අපට ද සිතාගත හැකි ය.

එහෙත් කෙදිනක හෝ ඈ ඔහු දුටුවාද? ඔව්, ඇතැම් විට දකින්නට ඇත. එසේ නොවුණි නම් වරක් දෙවරක් නොව තෙ වරක්ම ඔහු ගසින් බිමට වැටී තිබුණේ මන් ද? භූත ආත්මයකට ඔබව නො පෙනී ඔබ විසින් භූත ආත්මයක් දකිනතාක් කල් සියල්ල හොඳින් සිදු වේවි. එහෙත් භූතාත්මය ඔබේ දෙනෙත් තුළට බැල්මක් හෙළූ සැණින්ඔබේ සිහිය නැති වේ. අවසානයේ එක් ගිම්හාන සැන්දෑවක සුභ පතන්නන්ගේ සෑම බලවත් අනතුරු ඇඟවීමක් මසුළඟට විසි කොට ඔහු රහසින් වලව්වට ගොස් අබලන් වු තරප්පු පෙළ නැඟ කාමරයට එබිකම් කොට තිබේ. මුළු රාත්‍රියමත් දිවා කාලයේ වැඩි හරියකුත් ඇය ඉකි බිඳිමින් නිදා ගෙන සිටින බව කියැවෙන හෙයින් සමහර විට මේ ගැහැණු ළමයා ඒ වන විටත් නින්දේ සිටින්නට ඇත.

මේ නිසා ඔහු හොඳ සිහි කල්පනාවෙන් හැසිරිය යුතුව තිබිණි. පරම්පරා කීපයකට පසු වුවත් කොලු ගැටයන් වූ අපි ද ඔහුගේ අදූරදර්ශී ක්‍රියාකලාපය තදින් හෙළා දැක ඔහුට අනුකම්පා කළෙමු. ආදරයකිරීම වුවත් සෑහෙන තරමේ අනතුරුදායක කාර්යයකි. එසේ තිබිය දී භූතාත්මයකට ආදරය කිරීම ඉතාමත් භයානක ය. ඔහුට එය අමතක වූයේ ඇයි?

ඇය ඔහු වැළැක්වීමට පෙර ඔහු බලහත්කාරෙන් ඉදිරියට පැන ඇය සිපගෙන තිබිණි. ඇය යටි ගිරියෙන් කෑගසා ඇත. බොහෝ දෙනා විසින් ඇගේ ගිගිරිලි, ඉකිබිඳුම් හා උමතු දෙඩවිලි අසා තිබිණි. එහෙත් ඇය මහ හඬින් ගුගුරන හඬ කෙනෙකුට අසන්නට ලැබී ඇත්තේ එදා පමණි.

තැන් තැන්වල ඇවිදිමින් ආහාර ඉල්ලා ගෙන කා ජීවත් වන ප්‍රසිද්ධ සන්නාසියෙකු මේ වෙලාවේ මේ පාළු වලව්ව අසළින් නො ගියේ නම් ඔබටවත් මටවත් මේ ප්‍රදේශයේ බිහිසුණු ගෙරවිලි හඬ



පිළිබඳ පුවත අසන්නට නො ලැබෙණු ඇත. ඔහු අපේ ගම් ප්‍රදේශයේ සුසාන භූමිවල ඇවිදිමින් කාලය ගෙවා කුසගිනි වූ විට පමණක් දවස් දෙක තුනකට සැරයක් ගම තුළට පැමිණෙයි. ඔහුට කපුටු හඬ හා ගවයන්ගේ තප්පුලෑම පිළිබඳ අර්ථය තේරුම් ගැනීමෙ හැකියාවක් තිබිණි. එසේම අන් අයට නොඇසෙන සියුම් ශබ්ද ඔහුට පැහැදිලිව ඇසුණි. ගම් වැසි පිරිමි මේ ළමයාගේ අතුරුදහන් වීම ගැන සාකච්ඡා කරමින් සිටින විට මේ යාචකයා තමාට ඇසුණු භූතාත්මයක අසාමාන්‍ය ගෙරවිලි හඬ පිළිබඳ පුවත හෙළිදරව් කළේය.

පසු දා උදෑසන අපේ ගමේ නිර්භීත පිරිමි ළමයි දහදොළොස් දෙනෙක් වලව්වට ඇතුළු වූහ. ඔවුහු භූතාත්මයට තමන් වෙත ළං නොවීම පිණිස ගංගා නම් ගඟේ සුද්ධ ජලය හිස් මුදුනට ඉස, බඳ පටිවල යකඩ කැබලි සඟවා ගෙන සිටියහ. එහෙත් දඬු මුගුරු හෝ අවි ආයුධ රැගෙන යාමට කිසිවෙකුත් සිතුවේ නැති බව මම දිවුරා කියමි. ඒ කිසිවෙක් ගැහැණු ළමයාට කිසියම් හෝ හිංසාවක් කිරීමට නො සිතූහ. අවසානයේ ඉහළමහලේ කාමරය තුළ අවුරුදු සියයක් පමණ පැරණි කුඩා ඇඳේ මෙට්ටය මත වැතිර තිබූ පිරිමි ළමයාගේ මළ සිරුර ඔවුන්ට හමු විය.

ඔහු ගැහැණු ළමයා සිපගෙන ඇති බවට ඒකාන්ත සාක්ෂිය ඇගේ ක්ෂණික කෑගැසීම පමණක් ම නොවේ. කොල්ලාගේ මුවින් ගලාගොස් තිබූ ලේ දහරින් ද ඒ බව ඔප්පු විය. භූතාත්මයක් සිපගැනීම වෙනුවෙන් නිසැකව ම යමෙකුට ලැබෙන තෑග්ග එයයි.

සැබැවින්ම එය අපට බියකරු අනතුරු ඇඟවීමක් විය. එහෙත් භූතාත්මය කෙරෙහි වු මිනිසුන්ගේ ආදරය බිඳකින් හෝ අඩු නොවුණි. මිනිසුන් තමාට ආදරය කරන්නේ යැයි කියා ඇය කුමක් කරන්න ද? තමාට ආදරය කරන්නැයි ඇය කිසි දිනෙක ඔවුන්ගෙන් ඉල්ලා නැත. ඇය අවාසනාවන්ත ආදරවන්තයා මරා දැමුවේ නැත. ඇයට අපෙන් වෙන් වූ ලෝකයේමාරක ශාපයෙන් ගැළවීමට හැකියාවක් නොවී ය. මේ සියක් අවුරුදු කාලය තුළඇය එහි වාසය කරමින් කවුරුන් හෝ තමා කෙරෙහි පොළඹවා ගැනීමට උත්සාහ දරමින් සිට ඇත්තේ එක් වරක් පමණක් නොවේ.

එය සිදු වී වසර සියයකට වඩා ගත වී තිබේ. ඒ කාලේ පරංගි මෙහි විශාල ප්‍රදේශවල ඉන්ඩිගෝ වගා කළහ. ඔවුහු ඒකරාශී වී සිටියේ බෙංගාලේ වුවත් ඔරිස්සාව වූ අපේ ප්‍රාන්තයේ ද අසල්වැසි ප්‍රදේශවල දවිසිරි සිටියහ. අපේ ඉඩම්වල ඔවුන්ගේ වගාවන් නිසරු විය. එබැවින්පරංගීහුගොඩනගන ලද මනහර නිවාස ද අතහැර ප්‍රදේශයෙන් ඉක්මනින් පිට වී ගියහ.

ජනප්‍රවාදයේ එන ආකාරයට, තරුණ පරංගි තිදෙනෙකු විසින් ගැහැණු ළමයෙකු රැගෙනවිත් තිබේ. ඇය පැහැරගෙනැවිත් ඇත්තේ සුන්ඩාබන් නම් ග්‍රෝතික කණ්ඩායමකිනි. ඈ සුදු මහත්තයෙකුට දාව උපන් අසම්මත දියණියක වූවා ය. ඇයට මවගෙන් ලැබුණු මන පොබයන නැවුම් බවක් හා දඟකාර බවක් ද පියාගෙන් ලැබුණු දීප්තිමත් ජවි වර්ණයක් ද පිහිටා තිබිණි.

ඇගේ අමුතු ජන්ම ගතිය නිසා ඇයට අපේ ගැහැණුන් සමග එකතු වීමට නොහැකි විය. සුදු ලේ ඇති ගැහැණු ළමයෙකු සමග අපේ ස්ත්‍රීන් ගේ මිතුරු බව සිතාගත නොහැකි දෙයකි.

මුල දී ගැහැණු ළමයා ඇගේ ස්වාමිවරුන්ට අකීකරු වුවා ය. එහෙත්එයින් ඇයට දරුණු ලෙස දඬුවම් ලැබිණි. අවස්ථා කීපයක දී ම ඔවුන්ගෙන් ගැළවී පැන යාමට ගත් උත්සාහයන් ව්‍යාර්ථ වූ පසු ඈ අකීකරු බව පෙන්වමින් වසරක පමණ කාලයක් ගතවන්නට ඉඩ හැරියා ය.

එක් දවසක් පෘතුගිසීන් තිදෙනාට කිසියම් රාජකාරි කටයුත්තක් සඳහා ඔවුන්ගේ ප්‍රධාන කාර්යාලයට යාමට සිදු විය. මේ කාලයේ ප්‍රදේශයේ වසූරිය වසංගතය ද පැතිරෙමින් තිබිණි. පරංගි තිදෙනා ස්වදේශිකයන් සමඟ ඇසුර අතහැර බෝට්ටුවලින් නගරය කරා පිටත්ව ගියහ. මුහුදේ දියවැල් හොඳින් ඇති විට නගරයට ළඟා වීමට ගතවන්නේ එක් දිනක් පමණි.



ඔවුහු තරමක් ප්‍රමාද වී වුවත් පසු දා උදෑසන නගරයට ළඟා වූහ. කැලඹුණු කපුටු රංචුවක් බෝට්ටුවට ඉහළින් වට කරගෙන සිටිනු දැකගත හැකි විය. තරුණ පෘතුගීසීන් තිදෙනෙක් අඩක් අනුභව කළ ආහාරපාන සහිත බඳුන් වටා දරදඬු වී සිසිල් බවට පත්ව නිසල ව වැතිරී සිටියහ.

ගැහැණු ළමයා ඔවුන්ට දිවා ආහාරය පිළියෙල කර දී තිබිණි. පෙනී ගිය ආකාරයට නම් ඇය ආහාරවලට අනර්ඝ වසක් මිශ්‍ර කර තිබෙ.

වසර ගණනාවක් මේ සමාගමට ම සම්බන්ධ වී සිටි කපටි පුද්ගලයෙකු වූ වලව්වේ ආරක්ෂකයා, ඇය තම නිදහස පිණිස දරුණු ලන්සුවක් තබද්දී අපරාධ සහයකයෙකු ලෙස සිට ඇත. තරුණිය සුදු ජාතිකයින් විසින් සඟවා තබාගන්නා ලද රත්‍රන් සහ මුදල් තිබෙන ස්ථානපිළිබඳ තොරතුරු දැන සිටියාය. මේ වස්තුව රැගෙන පලා යාම දෙදෙනා අතර වූ ගිවිසුම විය. එහෙත් වස්තුව සඟවා තිබූ ස්ථානය හෙළිදරව් කළ විගසම ද්‍රෝහී ආරක්ෂකයා ඇයට පිහියෙන් ඇන සැඟවී පලා ගියේය.

දවස් දෙක තුනකට පසු තවත් පෘතුගීසිකණ්ඩායමක් ගමට පැමිණියහ. ඔවුහු වියරුවෙන් ගම් වැසියන්ට බයිනෙත්තුවලින් අනිමින් ගැහැණු ළමයාගේ මළ සිරුර වළ දැමීමට බල කළහ. එමෙන්ම ඔවුහු ඝාතකයා සෙවීම සඳහා සියලු ගෙවල් පරීක්ෂා කළහ. මේ සිද්ධිය නිසා කිලිටු වූ අපේ ගෙවල් දොරවල් පවිත්‍ර කිරීම සඳහා අසල්වැසි ගම් වලින් ගංගා නදියේ ශුද්ධ ජලය විශාල ප්‍රමාණයක් ලබා ගැනීමට සිදු විය.

එහෙත් මේ සියල්ලම දැන් අපැහැදිලි මතකයක් බවට මැකී ගොස් ඇත. මේ සිදුවීම් දැන් මිනිසුන් සඳහන් කරන්නේ කලාතුරකිනි. සුදු ජාතිකයන්ගේ ඉරණම සහ ගැහැණු ළමයාගේ ඝාතනය ඔවුන්ට ප්‍රියජනක අත්දැකීමක් නොවී ය. මා වැදගත් කොට සැලකුයේ භූතාත්මය ලෙස මා අදහස් කළඒ ගැහැණු ළමයා පමණි. අප ඇය වෙනස් එකියකැයි හොඳින් දැන සිටියත් ඇය අප අතර ම ජීවත්

චූතැනැත්තියකැයි යන සිතුවිල්ල නිරතුරු අපේ සිත් තුළ විය. ඈ භූතාත්මයක් වූවා පමණක් නොව මුහුදු හතකින් එහා සිට පැමිණි සුදු ලේ ඇත්තියක ද වූවාය. ඇය භූතාත්මයක් බවට පත්වීමෙන් පසු ඇගේ ලේවලට ඇති ඥාතීත්වය බොහෝ දුරට අහිමි වී ගිය බව අපි දැන සිටියෙමු. එහෙත් ඒ පිළිබඳ ඊට වඩා සුළු හෝ ගෞරවයක්ඇයට දක්වා උපකාර කිරීමට අපට නොහැකි විය.

ගමේ කිසිවෙකුගේ උපන්දිනයක්, මංගල්‍යයක් හෝ අවමඟුලක් වේවා, කිනම් හෝ ආගමික පූජාවක් පවත්වන්නේ නම් වේවා,එදින මැදියම් රැයේ වලව්වේ මිදුලට පූජාවක් රැගෙන යනු ලැබේ. ගමේ ගරු කටයුතු වැඩිහිටියෙකු වූ ප්‍රාථමික පාසලේ ප්‍රධානාචාරියා සැමදාම ඒ පිරිස ඉදිරියෙන් යන තැනැත්තා ය. ඔවුහු ළා බාල කොල්ලන් වූ අපට දුරක සිට පමණක් මේ සිද්ධිය නැරඹීමට අවස්ථාව සලසා දුන්හ. හැළි වළං හා මැටි පහන වලව්වත් නුග ගසක් අතරස්ථානයක තැබූ පසු ප්‍රධානාචාරියා මතුරන්න පටන්ගනියි.

"අහෝ අවාසනාවන්ත ළමිස්සියේ, නුඹේ කරුණාවන්ත ඥාති හිතවත්තයින් විසින් විටින් විට දෙනු ලබන පිණ්ඩ දානය යි මේ. මෙයින් සතුටු වනු මැනව. මෙතෙක් කලක් නුඹ විසින් අප ආරක්ෂා කළාක් මෙන් ඉදිරියටත් නුඹගේ තේජසින් අපේ ගම යක්ෂයින්ගෙන් රැකදෙන ලෙස යි මේ අයදින්නේ,අප කවදාහෝ නුඹ මේ ස්ථානයෙන් එළවා දැමීමට හෝ නුඹට හිරිහැර කිරීමට හෝ උත්සාහ ගෙන තිබේද? සත්තකින්ම නැහැ නේද? ඒ මක්නිසාද? නුඹ අපේ ම දියණියක සේ මෙතෙක් කල් බලා කියා ගත් බැවිනි. දෙවියන්ගෙන් නුඹට සාමය ලැබේවි."

මැතිරීමෙන් පසු මේ ස්ථානය හැරදමා පසුපසවත් නොබලා කණ්ඩායම ආපසු ගමට පැමිණෙති. ඉන්පසු කිසිවෙකු මිදුල දෙස බලන්නටවත්සිතන්නේ නැත. එහෙත් අපි වැඩිහිටියන්ට හොරෙන් ගං ඉවුරේ අපේ ප්‍රියතම ස්ථානයක සිට ඒ දෙස බලා සිටිමු. මැටි පහනේ සැලෙන සිළුවෙන් හා උස් පහත් වන සෙවණැලිවල චංචල භාවයෙන් කිසියම් ගුප්ත දෙයක් දර්ශනය වන්නේ යැයි අපට සිතිණි. අපි ලොමු දැහැ ගෙන ඒ දෙස බලා සිටියෙමු. පහන සැනෙකින් නිවී ගියේය.



"සාමාන්‍යයෙන් එයා කැමති නෑ එයා කන බොන දිහා අපි බලන් ඉන්නවාට. අප අතර සිටි අයෙක් පැසුවේ ය. ඉන්පසු අපි ඇයට ඇගේ පාඩුවේ ඉන්නට ඉඩදී ආපසු පැමිණියෙමු".

"ඒත් ප්‍රධානාචාරියාට ඈ කීකරුයි නේද?"

"ආචාරියා දන්නවා ඇයට කතා කරන විදිහ," අපේ කණ්ඩායමට එකතු වී සිටි ප්‍රධානාචාරියාගේ ගෝලයා විශ්වාසයෙන් යුතුව කියයි.

"මේ ලෝකයේ ඔහුට අවනත නොවන්නේ කවුද?" කිසිවෙක් ඔහුට ප්‍රතිඋත්තර දෙයි.

කෙසේ වුවත් නපුරෙන් ගම ආරක්ෂා කර දෙන්නැයි ප්‍රධානාචාරියා ඇගෙන් අයදින විට සැබැවින් ම ඔහු එයින් අදහස් කළේ ඇගෙන් නම් කිසිදු අනතුරක් අපේ ගමට සිදු නොවන බව යන්න මගේ වැටහීම විය. ඔහුගේ වචනවල තර්ජනාත්මක ස්වරයක් ගැබ්ව තිබිණි. අප කිසිදාක ඇය පලවා හැරීමට හෝ ඇයට හිරිහැර කිරීමට උත්සාහ ගෙන නැති බව ඇයට සිහිපත් කර දීමෙන් ප්‍රධානාචාරියා වෙන කිසියම් දෙයක් අදහස් කළා ද? මා සිත ව්‍යාකූල විය. ඈ ඉතා අහිංසක හා යහපත් තැනැත්තියක වූවා ය. ඇය වෙත කුහක ගතියක් පෙන්වීමට ප්‍රධානාචාරියාට කුමන අයිතියක් ද?

ඒ ගිම්හානයේ හැන්දෑවකි. දවස පුරාම දැඩි උණුසුම් සුළඟ හැමුවේය. මෙබඳු වේලාවන් හි දී සුළඟ හැර අන් සියල්ල ම නිසල වී පැවැතිණි. බොහෝ කලකට පෙර වලව්වේ දැවමුවා දොර ජනෙල් අතුරුදන් වී තිබිණි. සුළඟ ඉතාමත් ප්‍රචණ්ඩ ලෙස වලව්වේ සෑම අස්සක් මුල්ලක් නැර ම කැරකෙමින් විවිධාකාරයේ තියුණු ශබ්ද ජනිත කළේය. මම මේ ශබ්ද වලින් වශී වූයේ ඇයිදැයි නොදනිමි. මෙ බඳු අවස්ථාවල මගේ තාත්තාට මා නිදි කරවීමට අවශ්‍ය වී තිබුණත් මම නිදි නැතිව ඇඳ මත වාඩි වී එම ශබ්දවලට සවන් යොමා දැහැන්ගත වී සිටියෙමි. එවන් අවස්ථාවල මා රහසින් වලව්වට ඇතුළු වන්නේ ය

යන හැඟීමක් මට ඇති වේ. ඒ,ගැහැණු ළමයා සමඟ කෙටි නිහඬ ඇසුරකට වඩා වෙන කිසිවක් පිණිස නම් නොවේ. එහෙත් ඇය මගේ අදහස් තේරුම් නොගනී වියැයි මම බිය වීමි. ඒ සැකය නිසා මම වලව්වට යාම පිළිබඳ අදහස අතහැර දැමුවෙමි.

එක් දවසක් මේ හැඟීම ආදරයක් බව මම වීරත්වයෙන් හා තරමක් ආඩම්බරයකින් යුතුව වටහා ගත්තෙමි. ඒ සමඟම මට ලැජ්ජාවක් ද ඇති විය. මට මෙන්ම ගමේ අනෙක් පිරිමි ළමයින්ටද එ ලෙස දැනෙනවා විය හැක. මේ ගැහැණු ළමයාට අඩුම තරමින් අපට වඩා අවුරුදු සියයක් වත් වයසය යන්න අපට නොවැටහිණි. යමෙක් භූතයෙක් බවට පත් වූ විට ඔහුගේ හෝ ඇගේ වයස ගත නොවන බව එක්තරා දැනමුත්තෙක් අපට පවසා තිබිණි.

ඒ හද පාරන පුවත සැලවන විට අපි මධ්‍ය පාසලේ විභාගයට සූදානම් වෙමින් සිටියෙමු. ජරාවාස වූ වලව්ව ඉවත් කොට ඉඩම වෙනත් කටයුත්තක් සඳහා යොදා ගැනීමට රජය තීරණයක් ගෙන ඇත. සැන්දෑවේ අපේ ඉගෙනුම්කටයුතු අමතක කර, වැඩිහිටියන් මේ පිළිබඳ කළ සාකච්ඡාවලට ඇහුම්කන් දීම සඳහා අපි පාසලේ බිත්ති කඳු පිටිපසට වී සැඟව සිටියෙමු.

"වලව්ව විතරක් ඉතිරි කරන්න කියලා ආණ්ඩුවෙන් ඉල්ලා හිටින්ඩ අපට බැරි ද?"

"බැහැ බැහැ බංකොලොත් ඉඩම් රජයට අයිති දේපොළ බව ප්‍රාදේශීය සමින්දාර්ට දන්වා තිබෙනවා. ඒ හැරත් ආණ්ඩුව අවතාර ගැන කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ,"ගම් ප්‍රධානියා පැවසීය.

ඔහුගේ එම ප්‍රකාශයට පසු දිගු නිශ්ශබ්දතාවක් පැවති අතර අතරින් පතර කහින හඬ හා ඇණුම් හඬ ඇසුණි.

"ඉන් පසු කටුස්සෙක් චික් චික් ගැවේ ය."

"ඔව්, ඔව්," මිනිසුන් දෙදෙනෙකු කෙඳිරූහ.



"ඔව්, ඒ ගැහැණු දරුවට මොකද අපි කරන්නේ? මේ අවුරුදු ගණනාව ම ඇය අපට කිසිම කරදරයක් නොකර එහි වාසය කළා. ඈ කරුණාවන්ත භූතාත්මයක් යැයි විශ්වාස කිරිමට අප්‍රමාණ සාක්ෂි තියෙනවා."

නැවතත් කටුස්සෙක් "චික්, චික්," ගෑවේ ය.

"ඔව්, ඔව්," මෙවර මිනිසුන් බොහෝ දෙනෙක් කීහ.

සාකච්ඡාව බොහෝ වේලා පැවැතිණි. ගැහැණු ළමයා වෙනුවෙන් යමක් කළයුතු බවට සියලු දෙනාම එකඟ විය. එහෙත් ඇයට පිරිනැමීමට කිසිවෙකුට හෝ අමතර නිවසක් නොතිබිණි. ඇය යහපත් භූතාත්මයක්ය යන්න කෙසේ වෙතත් භූතාත්මයක් යනු භූතාත්මයක් ම යි. මිනිස් පවුලක් සමඟ ඇගේ වාසය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් ඇය වෙනුවෙන් අපට කළ හැකි කිසිවක් නොමැති කල ඇය ම පැමිණ අප කාගේ හෝ නිවසක පදිංචි වනු ඇත.

ඔවුන් තීරණයකට පැමිණෙන විට මධ්‍යම රාත්‍රිය පසු වී තිබිණි. ඊට බොහෝ වේලාවකට කලින් අපේ මව්වරුන් හා මාමාවරුන් විසින් බිත්ති පිටුපස සැඟවී සිටි අපි ගෙවල්වලට පන්නා දැමීමට කටයුතු කරන ලදී.

ගම්මුන්ගේ ඉල්ලීම මත ගොඩනැගිල්ල කඩා බිඳ දැමීමේ කටයුත්ත දින කීපයක් ප්‍රමාද කරන ලදී. එක් සුභ දවසක මළවුන් කැඳවීමේ දක්ෂ, ප්‍රසිද්ධ කට්ටඩියෙකු සැතපුම් ගණනක් දුර සිට කැඳවා ගෙන එන ලදී. ඔහු නළලේ රතුපාට ලොකු තිලකයක් ඇති උස මහත පුද්ගලයෙකි. අප අසා ඇති පරිදි ඔහු දුෂ්ට යක්දෙස්සියක ගේ කශේරුකාවෙන් කැටයම් කළ පබලු මාලයක් පැළඳ සිටියේය. ඔහුගේ මුහුණේ කිසිවිටෙක සිනහවක් නම් නොවීය.

එ දින අප සියලු දෙනාටම ශෝකී දිනයක් විය. පරිසරය ද වලාකුළුවලින් අන්ධකාරව පැවැතිණි. හිරිකඩ ද වැටුණි.

ගැහැණු ළමයාට පිදීම සඳහා ගමේ සෑම නිවසකින්ම පාහේ බත්, ඉදුණු කෙසෙල්, පොල් සහ කැවිලි වර්ග රැගෙනවිත් තිබිණි. පූජාවට සහභාගි වීමෙන් වැළකී සිටීමට කිසිවෙකුට සිත් නොදුන් අතර මුළු ගම ම වලව්ව අසළ මිදුලට රැස් වූහ. බොහෝ දෙනෙකු, විශේෂයෙන් ස්ත්‍රීන් හා කුඩා ළමයින් මේ වත්තට පැමිණියේ පළමු වරට ය.

ගෙනැවිත් තිබූ තෑගි භෝග වලව්ව ආලින්දයේ අර්ධ කවාකාර ලෙස තැන්පත් කෙරිණි. කට්ටඩියා ඒවා ඉදිරියේ පාර්සලයක් තබා සෙමින් සෙමින් එහි කවරය ඉවත් කළේ ය. එය සම්පූර්ණ මිනිස් හිස් කබලකි. මිනී ඇටයක් ද එහි වී ය. ඔහු එයින් අවකාශයේ රූප අඳිමින් මන්ත්‍ර කිහිපයක් ජප කළේ ය. ඔහුගේ මුහුණ රතු පැහැ ගත්තේ ය.

"කෙහෙ ද තී ? මං දැන් තුන් වරක්ම අණ කළා නොවෙ ද? වහාම මා ඉදිරියේ පෙනී සිටුව. මෙතරම් මුරණ්ඩුකම් පාන්න තිට මොන හයියක් ද?"

ගම් ප්‍රධානියා සමාව අයදින්නාසේ මෙසේ කීවේ ය. "බලන්න බාබා, ඇය උඩු මහලේ සැතපෙනවා ඇති. ඔබ දන්නවා ඇතිනේ ඇය රාත්‍රියට නිදන්නේ නැති වග."

කට්ටඩියා ගෝරනාඩු කරමින් තරප්පු පෙළ නැග්ගේය.

අපි අසරණව එකිනෙකා ගේ මුහුණු දෙස බලා ගත්තෙමු. මගේ දෑසට කඳුළු නැගිණි. ඇයට සැර පරුෂ ලෙස කතා කරන්නට එපා යැයි කවුරුන් හෝ කිව යුතුව තිබුණා නොවෙ ද?

උඩු මහලේ වූ පූජකයා ගේ පියවර හඬ අපට ඇසුණි. මඳ වේලාවකට පසු ඔහු නොතේරෙන බසින් යමක් ගිගිරුවේය. එම ශබ්දයත් ඒ හා නැගුණු ප්‍රතිනාදයත් නිසා ඒ සීතල උදෑසනේ වුවත් අපේ මුහුණුවලට දහඩිය බිඳු නැගිණි.



ඔහු ජයග්‍රාහී ලෙස ඉක්මනින්ම ආපසු පැමිණ මෙසේ අණදෙන්නට විය. "මෙන්න තිට, හිතේ හැටියට ඕනෑම දෙයක් අනුභව කරනු. ඉන්පසු මේ නිවස අතහැර පිට වී යනු."

අපේ හුස්ම මෙහොතකට මුළුමනින්ම නතර විය. කට්ටඩියා අවඥා සහගතව අප දෙස බලා හැකි තරම් උස් හඬින් එක්වරම කෑගැසුවේය.

"මොනවා! කෑම කන්නේ නෑ? දැනගනින් මං නරකයි කියන්න නම් එපා. කැවත් නැතත් උඹ මේ වලව්වෙනුත් ගම්මානෙනුත් වහාම පිට වී යා යුතුයි. ඔව් මේ දැන්ම වහාම."

"බාබා ඔබ ටිකක් නිහඬ වුණොත් හොඳයි නේ ද? ඈ අපට කිසිදාක අකීකරු වෙලා නැහැ නොවැ. ඇය ආහාර ගනීවි. කරුණාකර ඇයට කියන්න මේ අපේ කාරුණික ඉල්ලීමක් කියා. ගමේ ගෑණු මේ ඔක්කොම තෑගිභෝග අරන් ආවේ ඇයට තියෙන ලොකු ලෙන්ගතුකමකින්." ගම් ප්‍රධානියා කීවේය.

එහෙත් පූජකයා ඒ ගැන සැලකිල්ලක් දැක්වූයේ නැත. "ඔන්න ඇය පිටවී යනවා. ඉඩ දෙන්න, ඉඩ දෙන්න." ඔහු අපට කෑ ගැසුවේය. ඉක්මනින්ම පිරිස දෙපසට වූහ.

ඇය කිසිවක් අනුභව කළේ නැත. එහෙත් පිටවී යන්නැයි නියම කළ විට ඈ අප්‍රමාද ව එසේ කළා ය. සැබැවින් අපි ඇය නොදුටු වෙමු. එහෙත් ඇය ඒ අවස්ථාවේ කෙතරම් ගැඹුරු වේදනාවක් විඳින්නට ඇතිදැයි අපට දැනුණි. එහෙත් අපට දැණුන ඒ වේදනාව ඇය විඳි වේදනාවට වඩා ඉතාමත් සුළු යැයි අපට සිතුණි.

"ඉක්මන් කරනු! අන්න හරි, ඔහොම යං. මං පාර පෙන්වන්නම්." කට්ටඩියා කීවේ ය. ඔහු තම දකුණු අතෙහි වූ මිනී ඇට කැබැල්ලෙන් නොපෙනෙන භූතාත්මයට පාර පෙන්වමින් සෙනඟ පීරා ඉදිරියට ගියේ ය. ඔහු වම් අතින් තම ගෝලයාට උපදෙස්

ලබාදුන්නේ ය. ගෝලයා අද්භූත මිනී ඔලුව හා ආහාර ද්‍රව්‍ය රැගෙන පසුපසින් ගමන් කළේ ය.

සියලු දෙනා ම පූජකයා අනුව ගියහ. ගම්වැසියෝ සිරිපොද වැස්සට නොබිය ව මුහුණ දෙමින් මහ වැස්සක් පිළිබඳ බිය වෙමින් ගම පසු කර සැතපුමක් පමණ දුර ගමන් කළහ.

"නවතිනු!" උස තල් ගසක් යට නතර වෙමින් කට්ටඩියා අණ කළේ ය. අනතුරුව ඔහු අමුතු මන්තර කීපයක් මතුරමින් මිනී ඇටයෙන් ගසට තළමින් ගස වටා කැරකුණේ ය.

"දැන් මෙතැන් සිට මේ නුඹේ වාසස්ථානයයි. තේරුණා ද?" ගස් මුදුන දෙස බලා කට්ටඩියා කීවේ ය.

ඔහු ආඩම්බරයෙන් අප දෙසට දත් විලිස්සාසිනාසුණේ ය. " ඇයට ආයේ කිසිදාක ගස අතැර යන්න බැහැ. මං ඇයව ගසට හිර කර බැන්දා." ඔහු උදාරම් ලීලාවෙන් පැවසුවේය.

සියල්ලෝම ආපසු හැරුණාහ. ගමේ පිරිමි කට්ටඩියා වට කරගෙන ඉදිරියෙන් ගමන් කළහ. ළමයින් වූ අපි ගැහැණුන් සමග සෙමින් ගමන් කළෙමු.

අපි සියලු දෙනා නිහඬව ඇවිද ගෙන ගියෙමු. ඉදහිට අතරමඟ කිසිවෙක් ඉකිබිඳිනු ඇසිණි. අනතුරු සැමදෙනා ම හැකිතාක් නිශ්ශබ්දව වැළපෙන්නට වූහ.

අප ගමට ළඟා වන විට කම්කරුවන් වලව්ව කඩා බිඳ දැමීම ආරම්භ කර තිබිණි. වර්ෂාව නිසා ඔවුන්ගේ කාර්යය පහසු වූ බව කොන්ත්‍රාත්කරු ගම් ප්‍රධානියාට දන්වා සිටියේ ය.

වැසි සහිත දින තුන හතරකට පසු අහස හොඳින් පැහැදිලි දිනයක් උදා විය. සඳ එළිය පැතිරී තිබිණි. සඳ එළිය ඇති වෙනත් රාත්‍රීන්හි මෙන් මේ රාත්‍රියේත් ළමයින් වූ අපි ඔට්ටු සෙල්ලම් කිරීම



සඳහා ගම පිටුපස ඇති බිම් පෙදෙසට රැස් වූයෙමු. එහෙත් අපේ ක්‍රීඩාවේ උද්යෝගී බවත් නොවී ය. අවසානයේ අයෙක් මෙසේ කීවේ යː "මෙතැන පිට්ටනිය තරමක් පාතයි. මෙතැන තාම තෙතයි කියලා නුඹලට පේන්නේ නැද්ද? ඇයි උසැති වියළි තණ බිම දිහාවට යන්නේ නැත්තේ?"

ඔහු මෙසේ කියා නිමා වන්නටත් පෙර ම අපි දුවන්නට පටන් ගතිමු. අපි සුළු වේලාවකින් තල් ගස වෙත ළඟා වූවෙමු. ඒ සමඟ අපේ සිත සෙල්ලමට ද නැඹුරු වේ. අපි අපේ අසරණ භූතාත්මය අසළට වී මධ්‍යම රාත්‍රිය වන තුරුත් සතුටින් සෙල්ලම් කරමු.

ගම්භාන සෘතුවේ නිවාඩුව නිමා වන තුරු සැම සවසකම අපි එහි යන්නෙමු. නිවාඩුව අවසන් වී මම උසස් පාසලකට ඇතුළත් වීම සඳහා නගරයට ගියෙමි. මම ඊට පෙර කිසිදාක නගරයක වාසය කොට නැත්තෙමි. එහෙත් ඉක්මණින් ම මා එහි විවිධ ප්‍රිය මනාප දේවල්වල ඇලී ගැලී සිටින්නෙකු බවට පත් විය. මට ගමේ භූතාත්මය පිළිබඳ අමතක විය.

මාස තුනකට පසු පූජා නිවාඩුව ලැබිණි. මම ගෙදර පැමිණෙමින් සිටියෙමි. ආසන්නයේ ම ඇති බස් නැවතුමේ සිට මගේ ගමට සැතපුම් කීපයක් පයින් යා යුතුව ඇත. මම මහත් උනන්දුවෙන් යුතුව පියවර තැබුවෙමි.තණ බිම හරහා ඇවිද යන විට ක්ෂණිකව ම තල් ගස මගේ නෙත ගැටුණි. මගේ දෙපා මොහොතක් අප්‍රාණික විය. තල් ගස මැරී ගොස් ය. එයට හෙනයක් වැදී අතු ඉති දැවී කුඩා කැබැලිවලට කැඩී බිඳී ගොස් තිබිණි.වේදනා බර හදවතින් මම නැවතත් ඇවිද ගෙන ගියෙමි. සති දෙකේ පූජා නිවාඩුවේ දී කිසිම පිරිමි ළමයෙකු ඒ ගැහැණු ළමයා ගැන කතා කළේ නැත. ඒ වැසි කාලය වූ නිසා තණ බිමේ සෙල්ලම් කිරීමට යෑමේ ප්‍රශ්නයක් ද නොවී ය. ඔට්ටු සෙල්ලම් කරන වයස පසු වී ගිය අතර මගේ ගමට පැමිණීම ද ක්‍රමයෙන් අඩු වී ගියේ ය.

ගමේ අලුත්ළමා පරපුර බොහෙවින් වෙනස් ය. ඔවුහු ඉතාමත් මෝඩ වෙති. ඔවුන්ට ඇත්තේ අවතාර පිළිබඳ බියක් පමණි.



ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
02 OCT 2015